ආණමඩුව කාවන්තිස්සගම ප්‍රදේශයේ චීවරධාරියෙකු, පිණ්ඩපාතයේ යන මුවාවෙන් නිවසක පැමිණ බාලවයස් දැරියක් බරපතල ලිංගික අපයෝජනයට ලක් කිරීමේ සිදුවීමක්, අරුණ පුවත්පතේ (පෙබ. 15, 2023) වාර්තා වී තිබුණේ මෙසේයි.

සිරස්තලය - "පිණ්ඩපාතේ වැඩි, මහලු චීවරධාරියා මල් කැකුළක පෙති සිඳලා"

බරපතල ලිංගික අපයෝජනයක් "මල් කැකුළක පෙති සිදීමක්" ලෙසට පෙන්වා දීම ඔස්සේ, අපයෝජනයට ලක්වූ බාලවයස් දැරියගේ ජීවිතයට නැවත යථා තත්වයට පත් කළ නොහැකි හානියක් සිදුවී ඇති බවක් ගම්‍ය නොවන්නේ ද? එය ලිංගික අපයෝජනයට ලක්වූවන් වෙත සමාජයෙන් එල්ල වන කොන් කිරීම සහ ගර්භාව තීව්‍ර නොකරන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

***අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!



පිණ්ඩපාතේ වැඩි
මහලු චීවරධාරියා
මල් කැකුළක
පෙති සිඳලා

2023-02-15

ආණමඩුව කාවන්තිස්සගම ප්‍රදේශයේ 79 හැවිරිදි චීවරධාරියකු පිණ්ඩපාතයේ එන මුවාවෙන් නිවසකට පැමිණ අට හැවිරිදි දැරියකට බරපතළ ලිංගික අපයෝජනය කිරීමේ චෝදනාවට